# Landscaping

## උද්‍යානයේ අලංකාරය වැඩි කරන



# දිය ඇල්ලක්

## සකස් කර ගනිමු



**පසුගිය කලාපයේ අපි මැදමිදුලකට සුදුසු උද්‍යාන සැකසුම් ගණනාවක් සාකච්ඡා කළෙමු. මෙවර අපි මැද මිදුලට හෝ ඉදිරිපස උද්‍යානයට හෝ සඳළුතලයේ උද්‍යානයට හෝ මුළුතැන්ගෙය ආශ්‍රිත උද්‍යානයට සුදුසු දිය ඇල්ලක් සකස් කර ගැනීම පිළිබඳව අවධානය යොමු කරමු.**

දිය ඇල්ලක් සකස් කර ගැනීමේදී පළමුව අවධානය යොමු කළ යුතු ප්‍රධාන කරුණක් තිබේ. එනම්, එය යොදන ස්ථානය පිළිබඳවයි. මැද මිදුලක් සඳහා දියඇල්ලක් යෙදීමට ඔබ අදහස් කළේ යැයි සිතමු. එහිදී ඔබ ඒ සඳහා යොදා ගන්නා නිර්මාණය මැද මිදුලෙන් අපි බලාපොරොත්තු වන නිවස තුළට හිරු එළිය හා වාතාශ්‍රය ගෙන ඒමේ ක්‍රියාවලියට බාධාවක් නොවන පරිදි තෝරා ගැනීමට වගබලා ගත යුතු වේ.

**ඉදිරිපස උද්‍යානයට** දිය ඇල්ලක් යොදා ගැනීමේදී උත්සව අවස්ථාවකට බාධාවක් නොවන ලෙස උද්‍යානයේ පසෙකට වන සේ දිය ඇල්ල නිර්මාණය කර ගැනීම වඩාත් සුදුසු වේ. ඒ අතරම සෙවන සහිත ස්ථානයක හෝ සෙවන සහිත පරිසරයක් ගොඩනගා ගැනීමෙන් එහි අලංකාරය එලෙසම පවත්වාගෙන යාමට හැකි වනු ඇත. නැතහොත් කෙලින්ම සූර්යාලෝකය පොකුණ තුළට පතිත නොවීමෙන් පොකුණ තුල ඇල්ගී වර්ග වර්ධනය වී, ඒවා පෙඳපාසි හා දියසෙවල බවට පත් වීමෙන් ඔබේ දිය ඇල්ල හා පොකුණ අතහැර දැමූ තත්වයකට පත් වනු ඇත

**සඳළුතලයේදී** දිය ඇල්ල සවිකරනු ලබන ස්ථානයේ සෙවන ගෙනෙන ශාක විශේෂයෙන්ම ජෑම් ගස් වර්ග සහිත මල් පෝච්චි කිහිපයක් යොදා ගැනීම අත්‍යාවශ්‍ය වේ. සඳළුතලය සඳහා බරින් වැඩි සිමෙන්ති හෝ කොම්පෝස්ට් නිර්මාණය සුදුසු නොවන අතර, ඒ සමග ෆයිබර්ග්ලාස් තාක්ෂණය යොදා ගනිමින් ස්වාභාවික පෙනුමක් එන ආකාරයට සකස් කළ දිය ඇලි හෝ ගල් විශේෂ යොදා ගැනීම වඩාත් සුදුසු වේ.

**මුළුතැන්ගෙය ආශ්‍රිත උද්‍යානයටද** මෙසේ යෙදීමේදී අපි එම දියඇල්ල හා පොකුණ ආශ්‍රිතව නිවසට අවශ්‍ය පලාවර්ග වගාකර ගැනීමට කටයුතු කරන්නෙමු. එහිදී එම පොකුණෙහි ජලයට ඇල්බට් සොලියුෂන් නමැති පොහොර විශේෂය යොදාගනු ලබන අතර, දියඇල්ල මත යොදන වෙනත් විසිතුරු ශාක වෙනුවට මුගුණුවැන්න, කංකුං, ගොටුකොළ, වැල්කොහිල, නිවිති, නිරමුල්ලිය, ආදී ශාක යොදා ගත හැකිය.

**ඉහත කුමන ස්ථානයක සකස් කරනු ලබන දිය ඇල්ලකදී වුවද පිළිපැදිය යුතු ජාත්‍යන්තර වශයෙන් ක්‍රියාත්මක වන රීති පද්ධතියක් දෙස දැන් අපගේ අවධානය යොමු කරමු.** දිය ඇල්ලේ ජලය එක් රැස්ව පවතින පොකුණ ගැඹුරින් අඩි 1, 1/2 නොහොත් අඟල් දහඅටකට පවත්වා ගැනීම අත්‍යාවශ්‍ය වේ. මෙය ජාත්‍යන්තර වශයෙන් පවතින රීතියකි. කුඩා දරුවකු හෝ බීමත් පුද්ගලයකු හෝ රෝගියකු හෝ පොකුණ තුළට වැටීමෙන් සිදුවන ජීවිත හානි අවම කර ගැනීම සඳහා ගෘහ ආශ්‍රිත පොකුණු තැනීමේදී මෙම රීතිය වෙත අවධානය යොමු කරනු ලැබේ.

